**පානදුර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

**1.** මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පළාත් පාලන ආයතනවල ගිණුම් තැබීමේ පරිපාටිය අනුව ස්ථාවර වත්කම්වල එකතුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ හා ප්‍රාග්ධනයට ආධාර මගින් දායකවීමේ ගිණුම්වල එකතුව සමාන විය යුතු වුවත්, එම ගිණුම් අතර රු.678,765 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල 2019 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු.120,316 ක පුනරාවර්තන වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.1,009,678 ක් වූ වරෙන්තු ගාස්තු මුදල වියදම් පාලන ගිණුම හර කර හිඟහිටි වරිපනම් ගිණුම බැර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.1,009,678 ක් වැඩියෙන් හා හිඟහිටි වරිපනම් බදු ගිණුමේ ශේෂය රු.1,009,678 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2017 වර්ෂයේදී 2018 වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.1,670,654 ක් වූ කලින් ලද වරිපනම් මුදල සමාලෝචිත වර්ෂයේදී කලින් ලද ආදායම් ගිණුම හර කර ඇතත් එකී ශේෂය හිඟහිටි වරිපනම් ගිණුමට බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු සඳහා දෙන ලද රු.826,271 ක් වූ දුන් වට්ටම් , වියදම් පාලන ගිණුම හර කර හිඟහිටි වරිපනම් බදු ගිණුම බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (vi) | පොදු පරිපාලනය වැඩ සටහනෙහි වෙනත් ආදායම් හා පොදු අවශ්‍යාක සේවා වැඩ සටහනේ කුලී මුදල් පිළිවෙලින් රු.10,791,838 ක් හා රු.2,236,050 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (vii) | 2017 විගණකාධිපති වාර්තාවේ 2.2.1 (උ) නිවැරදි කිරිමේදී රු.52,838 ක ශේෂයක් ඌනතා අතිරික්තතා ගිණුම හර කර ස්ථාවර තැන්පත් ගිණුම බැර කලයුතු වුවත්, කිසිඳු හර සටහනකින් තොරව ඉහත කී ශේෂය ඌනතා අතිරික්තතා ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ණය පදනම මත ලබා දුන් රු.11,934,000 ක් වටිනා කම්පැක්ටර් රථය සඳහා වර්ෂය තුල මුද්දර ආදායමින් අයකර ගෙන තිබූ රු.620,000 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද , කම්පැක්ටර් රථයේ වටිනාකම උපයෝගි සේවා ගිණුම හර කර පළාත් සභා ණය ගිණුම බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ix) | 2017 වර්ෂයේදී පළාත් සභා ණය පදනම යටතේ ලබාදී තිබූ ට්‍රැක්ටර් හා ටේලර් 02 ට අදාල 2018 දෙසැම්බර් 31 දක්වා මුද්දර ගාස්තු වලින් අයකර ගෙන තිබූ මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | මුද්දර ගාස්තු ආදායමින් ණය වාරික අයකර ගෙන ඇති බව ගිණුම්කරන අවස්ථාවේ ලැබී නැත. |
| (x) | සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද රු.6,447,284 ක්වූ විදුලි උපකරණ , විදුලි ගබඩා ගිණුමට රු.647,289 ක් ලෙස සටහන් කිරිම හේතුවෙන් විදුලි ගබඩා ගිණුමේ ශේෂය රු.5,799,995 ක් වැඩියෙන් හා වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (xi) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවිය යුතු රු.3,170,608 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (xii) | පොදු පරිපාලනය වැඩ සටහනේ ප්‍රවාහන හා අවශ්‍යතා සේවා සඳහා වියදම රු.498,135 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (xiii) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු රු.200,000 ක මුදල පුනරාවර්තන වියදම් යටතේ නොදක්වා ප්‍රාග්ධන වැය යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (xiv) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.81,110 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (xv) | සමාලෝචිත වර්ෂයේදී ගෙවා නිම කරන ලද සභා කර්මාන්තයක් සඳහා රු.70,768 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි |
| (xvi) | මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය රු.1,167,500 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.294,787,470 ක් වූ ගිණුම් විෂයන් 10 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 85,725,192 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | ගිණුම් නැවත පරික්ෂා කර බලා නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති සඳහා ලද රු.1,516,322 ක් වූ වැට් බදු මුදල් ද ඇතුළුව වර්ෂය අවසානයට ගෙවිය යුතු වැට් බදු ගිණුමේ ශේෂය රු.4,006,387 ක් විය. | ගෙවිය යුතු ශේෂ කාලීනව නිරවුල් කිරිම කල යුතුවේ. | ව්‍යාපෘති සඳහා ලද වැට් බදු මුදල් යැවිය යුත්තේ කාටද යන්න සොයා බලා ඒ අනුව කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ණයහිමි ලේඛන හා විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.42,806,299 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | 2019 අවසන් ගිණුමින් නිවැරදි කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | | |
| (i) 147 හා 149 වගන්තිය | - | 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල සංවර්ධන පනතේ සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක් සඳහා බලපත්‍ර ලබාදීමේදී වර්ෂයේ ලැබීම් වලින් සියයට එකක ගාස්තුවක් අයකල යුතු වුවත්, හෝටල් 10 ක් වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරවද ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. | වාර්ෂික ලැබීම් වලින් සියයට 01 ක් අයකර වෙළඳ බලපත්‍රයක් නිකුත් කල යුතුවේ. | හෝටල් 08 ක් වෙත වෙළඳ බලපත්‍ර ලබා ගන්නා ලෙස දන්වා යවන ලද බව හා එක් හෝටලයක් බදු මුදල් ගෙවා ඇති බවත් තවත් හෝටලයකින් සංචාරක බදු අයවිය යුතු නොමැති බවත් දන්වා ඇත. |
| (ii) 154(1) වගන්තිය | 1,336,505 | ඉඩම් කට්ටිකර විකිණීම් 03 කින් සියයට එකේ බදු ආදායම් පරික්ෂකගේ තක්සේරු වටිනාකම පදනම් කරගෙන අයකර තිබුණි. | වෙන්දේසි ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 01 ක් බදු ලෙස අයකල යුතුවේ. | සියයට 01 ක් බදු ගෙවන ලෙස දන්වා ඇතත්, නොගෙවීම නිසා නීතිමය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ආදායම් පරික්ෂකට දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (iii) 160 වගන්තිය | | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අය කර ගැනිමට කටයුතු කල යුතුවේ. | හිඟ වරිපනම් බදු අය කරන ලෙසටත් එසේ නොහැකි නම් දේපල තහනම් කිරිමටත් , ආදායම් පරික්ෂකවරුන්ට උපදෙස් දී ඇත. |
| (ආ) | 988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 126,193,162 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සැම වර්ෂයකටම වරක් හෝ පරික්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | වාර්ෂිකව සමීක්ෂණය කල යුතුවේ. | සභාව සතු ඉඩම් පිලිබඳ ලේඛනයක් නඩත්තු කිරිමට කටයුතු කරන අතර ඉඩම් මැනිමේ කටයුතු සිදු කරමින් පවති. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 1,675,050 | දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ විගසම පිය විය යුතු වුවත් එසේ කර නොතිබුණි. | අත්තිකාරම් නියමිත පරිදි පියවීම් කල යුතුවේ. | වසර දහයකට පෙර සිට පැවත එන හිඟය සොයා බලා කටයුතු කරමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571(1) හා (2) | 9,356,509 | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුවේ. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය | - | වාහන 31 ක ඉන්ධන දැවීම පරික්ෂා කර නොතිබුණි. | ඉන්ධන දැවීම වාර්ෂිකව පරික්ෂා කලයුතුවේ. | වාහන 06 ක ඉන්ධන පරික්ෂා කර ඇති අතර, ඉතිරි වාහන වල ඉන්ධන දැවීම පරික්ෂාව සිදු කිරිමට කටයුතු කරමි. |
| (ඉ) | 2017 දෙසැම්බර් 08 දිනැති අංක 2049 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | - | සමාලෝචිත වර්ෂය සඳහා ත්‍රි රෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ගාස්තුවක් ලෙස රු.750 ක මුදලක් අයකල යුතු බවට තීරණය කර | ත්‍රි රෝද රථ නවතා තැබීමේ ගාස්තු අයකල යුතුවේ. | ත්‍රි රෝද රථ නවතා තැබීමේ ස්ථාන හදුනාගනිමින් සිටින බවත් ඉන් පසු එකී ස්ථාන ලියා පදිංචි |

| | | |
|---|---|---|
| ජනරජයේ ගැසට් පත්‍රය | ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කිරිමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.58,834,435 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.65,254,035 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 25,631,310 | 31,760,665 | 18,422,124 | 26,544,049 | 2,232,500 | 29,178,683 | 18,107,118 | 21,961,625 |
| (ii) | කුලී | 2,151,108 | 7,045,713 | 6,716,140 | 3,645,828 | 10,135,500 | 3,069,708 | 2,750,493 | 3,672,980 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 350,000 | 625,200 | 573,700 | 51,500 | 475,500 | 5,304,320 | 5,304,320 | - |
| (iv) | වෙනත් ආදායම් | 70,425,500 | 63,500,000 | 79,174,655 | 60,468,348 | 67,461,500 | 61,000,000 | 65,205,657 | 70,379,045 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයට අදාල වරිපනම් බදු බිල් කිරිම රු.29,359,835 ක් වු අතර 2018 දෙසැම්බර් 31 දිනට ඉන් රු.13,210,735 ක් හෙවත් සියයට 45 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතු වේ. | 2019 ජුලි 10 වන විට හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.4,967,988 ක් අයකරගෙන ඇති බවත් හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා ජංගම සේවා පවත්වමි. |

2.2.3 වෙළඳ ස්ථාන කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 ජනවාරි 01 දිනට හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂය රු.3,772,005 ක් වු අතර එකී ශේෂයෙන් රු.3,316,255 ක් හෙවත් සියයට 88 ක් වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. මෙම හිග කඩකුලී ශේෂය තුල කෙසෙල්වත්ත පොලීසියෙන් අයවිය යුතු රු.2,434,613 ක ශේෂයක් හා වෙළඳසැල් 13 කට අදාලව රු.912,900 ක හිඟ කඩකුලී ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලි අය කිරිමට කටයුතු කල යුතුවේ. | හිඟ කුලි අයකර ගැනිම සඳහා නඩු පවරා ඇති නමුත් විෂය වස්තුන් නොමැතිවීම හේතුවෙන් නඩු බහා තබා ඇති අතර අයකර ගත නොහැකි කුලී පොත් වලින් කපා හැරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) උසාවි දඩ | | |
| රු.5,716,191 ක් අයවිය යුතුව තිබු නමුත් වර්ෂය තුලදී උසාවි දඩ ආදායම ලෙස කිසිදු මුදලක් ලැබී නොතිබුණි. | උසාවි දඩ ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | 2015 වර්ෂයේ සිට උසාවි දඩ සඳහා උප ලේඛන සකස් කර පළාත් ආදායම් කොමසාරිස් වෙත යවන ලදි. |
| (ii) මුද්දර ගාස්තු | | |
| 2018 වර්ෂය සඳහා මුද්දර ගාස්තු ලෙස රු.128,151,305 ක් ලැබිය යුතුව තිබු නමුත් වර්ෂය තුල ලැබී තිබුණේ පෙර වර්ෂවලට අදාල රු.59,566,648 ක මුදලක් හා රු.15,000,000 ක අත්තිකාරම් මුදලක් පමණි. | මුද්දර ආදායම් ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | එක් එක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් මුද්දර ගාස්තු ලැබි ඇති ආකාරය පෙන්වා දි ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සභාවට යෝජනා කර ඉදිරියේදි පනවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| (i) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ඇ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කලයුතු වුවද අයවැය ලේඛනයේ නොමැති රු.මි. 152.2 ක ප්‍රතිපාදනයක් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණි. | අයවැය ලේඛනයට අනුකූල වන ආකාරයට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කල යුතුවේ. | අයවැය ලේඛනය හා ක්‍රියාකාරි සැලැස්ම සැකසිමේදි සිදු වු අඩුපාඩු නිවැරදි කර ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කරමි. |
| (ii) 2018 වර්ෂය තුළ ක්‍රියාකාරි සැලැස්ම යටතේ හඳුනාගත් අංශ 07 ක ක්‍රියාකාරකම් 124 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කලද , මාර්ග ඉදි කිරිම් හැර අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් අක්මුදල් සැලැස්මක් හෝ ක්‍රියාත්මක කිරිමේ කාලරාමුවක් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | ව්‍යාපෘති වෙනුවෙන් අක්මුදල් සැලැස්මක් හා කාල වකවානු තීරණය කල යුතුවේ. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ පොදු පරිපාලනය හා කළමනාකරණයට අදාල ප්‍රතිපාදන දක්වා චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මක් ඉදිරියේදි ඉදිරිපත් කරමි. |
| (iii) 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් රු.මි.95.50 ක පිරිවැය වු ව්‍යාපෘති 41ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. තවද කෙසෙල්වත්ත උප කාර්යාල බල | ක්‍රියාකාරි සැලැස්ම තුළ ව්‍යාපෘති පැහැදිලිව හඳුනාගෙන එම ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කිරිමට නොහැකි වී ඇති අතර නව සභාවත් සමඟ ක්‍රියාකාරි සැලැස්මට පරිබාහිරව ව්‍යාපෘති ඉටු කිරිම සිදු විය. |

| | | |
|---|---|---|
| ප්‍රදේශයේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කල ව්‍යාපෘති හඳුනාගෙන නොතිබූ අතර ඒ සඳහා වෙන් කල රු.මි.80 න් රු.මි.4.8 කට අදාල ව්‍යාපෘති පමණක් 2018 වර්ෂය තුළ ඉටුකර තිබුණි. | | |
| (iv) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කර ප්‍රගතිය මිණුම් කලයුතු වුවද , ක්‍රියාකාරකම් ඉටු කිරිමේ ප්‍රගතිය මිණුම් කිරිමේ ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය ලිඛිතව වාර්තා කල යුතුවේ. | වියදම් වෙන් වෙන් වශයෙන් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර අධීක්ෂණය සඳහා ක්‍රම වේදයන් ඉදිරියේදී සකස් කරනු ලැබේ. |
| (v) 2018 වර්ෂය තුළ සභා අරමුදලින් ක්‍රියාත්මක කර තිබූ රු.මි.33.51 ක ඇස්තමේන්තු පිරිවැය වූ ව්‍යාපෘති 47 ක් ක්‍රියාකාරි සැලැස්මට පරිබාහිරව ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | අයවැය ලේඛනයේ ප්‍රතිපාදන මත ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුවේ. | නව සභාවක් පත්වීමත් සමඟ ක්‍රියාකාරි සැලැස්මේ ව්‍යාපෘති ඉටුකර නොතිබූ අතර මන්ත්‍රී යෝජනා අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| සභාව විසින් 2018 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදි 2017 ජුලි 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ BD/CBP/4/1/2-2018 ප්‍රකාරව නව ප්‍රතිපත්තිමය උපාය මාර්ග තුන පිළිබඳව සලකා බලා නොතිබූ අතර තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිම සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකකර නොතිබුණු අතර හඳුනාගත් දර්ශක සඳහා සියළු පාර්ශවයන් නියෝජනය වන පරිදි දත්ත එක් රැස් කිරිමේ ක්‍රමවේදයක්ද අනුගමනය කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා අයවැයට ඇතුලත් කර ඉටු කර ගැනිමට හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරිමට කටයුතු කල යුතුවේ. | පළාත් පාලන අමාත්‍යාංශයේ දැනුවත් කිරීම් අනුව 2019 සිට 2023 දක්වා සැලැස්මක් සකස් කර 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 12 ක පුරප්පාඩු 36 ක් වූ අතර, ආදේශක පදනමින් 24 ක් හා , කොන්ත්‍රාත් පදනමින් 02 ක්ද බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගත යුතු අතර ආදේශක හා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සිදු නොකළ යුතුවේ. | සේවකයින් 21 ක පුරප්පාඩු සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) | මියගිය , ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 20 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,031,938 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | හිඟ ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 වර්ෂයේදී කොළඹ මහ නගර සභාවේ සිට ස්ථාන මාරු ලබා පැමිණි රියදුරෙකු සභාවේ සේවයේ නොයෙදුණද , එකී සේවකයා වෙනුවෙන් 2018 මැයි දක්වා වැටුප් ගෙවීම වෙනුවෙන් රු.1,220,585 ක අතිරේක වැය බරක් දරා තිබුණි. | සභාවේ රාජකාරි ඉටු කර නොමැති බැවින් සභාව විසින් ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කල යුතුවේ. | සභාවට ස්ථාන මාරු වී පැමිණි රියදුරු සඳහා වැටුප් ගෙවිමේ පදනම මත ප්‍රධාන අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර ඇත. මේ වන විට සභාවේ සේවය නොකරන අතර මොරටුව නගර සභාවට මුදා හැර ඇත. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත් ප්‍රදේශ වල විථි පහන් සඳහා සේවා සැපයීම හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදු කර තිබියදී වීථි පහන් දැල්වීම වෙනුවෙන් 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ගිවිසුමකින් තොරව ලංකා විදුලි පුද්ගලික සමාගමට රු.766,722 ක මුදලක් ගෙවා තිබුණි. | නඩත්තු කටයුතු සභාව විසින් සිදු කරන බැවින් ගෙවිම් සිදු නොකල යුතුවේ. | අළුත්වැඩියා නඩත්තු සභාව සිදු කලද විදුලියට අදාල ගෙවිම් පමණක් සිදු කිරිමට ගිවිසගෙන ඇත. |

3.4 වත්කම් කළමණාකරණය
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණය කර නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි | සභාව සතු ඉඩම් සමීක්ෂණය කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතුවේ. | සභාව සතු ඉඩම් පිලිබඳව උපකාර්යාලීය මට්ටමින් තොරතුරු රැස් කරමින් පවති. |

3.5. කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කොන්ක්‍රීට් හා තාර දමා සංවර්ධනය කලයුතු මාර්ග 04 ක් වෙනුවෙන් නිර්මාණ සකස් කර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.3,433,875 ක් ගෙවා තිබුණි. | ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරිමට පෙර නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගත යුතුවේ. | ඉදිකල යුතු ස්ථාන පිලිබඳ දළ සැලැස්මක් සකස් කරයි. ABC පිරවිය යුතු ස්ථාන හඳුනාගැනීමක් සිදු නොවන අතර මින් ඉදිරියට එම ස්ථාන හඳුනාගැනීමට කටයුතු කරමි. සකස් කල නිර්මාණ අතපසු වීමකින් අත්සන් කර නොතිබුණු අතර මින් ඉදිරියට ඒවා නිවැරදි කරමි. |
| (ආ) 2018 ජුනි 30 දිනැති අංක LGD/03/2018 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කල මාර්ග 05 ක ඝණකම හා සම්පිඩන ශක්තිය පරික්ෂා කිරිමකින් තොරව රු.3,745,795 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | චක්‍රලේඛ නිකුත් කර තිබුණද දැනුවත් විමේ ප්‍රමාදයන් සිදු විය. මෙම මාර්ග චක්‍රලේඛ වලට පෙර ඇස්තමේන්තු සකස් කර තිබූ ඒවා විය. |
| (ඇ) මූලික ඇස්තමේන්තු මිණුම් වාර්තාවල වැඩ විස්තරයන්ට පටහැනිව අවසන් ගෙවීම් වාර්තාවේ වැඩි රේටයන් භාවිතා කර ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් ABC මිලදී ගැනීම සඳහා රු.243,933 ක් කොන්ත්‍රාත් සමිති වෙත වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු වැඩ විස්තරයට අනුව ABC සඳහා ගෙවීම් කලයුතු අතර වැඩිපුර ගෙවූ මුදල අය කල යුතුවේ. | රු.2,163 රේටයට ABCසැපයිමට අපහසු බැවින් තාක්ෂණ නිලධාරින් සමඟ සාකච්ජා කර රු.3,194 රේටය භාවිතා කරන ලදී. |

| | | |
|---|---|---|
| (ඇ) ව්‍යාපෘති දෙකක මාර්ග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමිති වෙත ඇස්තමේන්තුගත කොන්ක්‍රීට් කියුබික් මීටර් ප්‍රමාණය ඉක්මවා කියුබික් මීටර් 6.05 ක් සඳහා රු.95,763 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු ඉක්මවා අනුමැතියකින් තොරව ගෙවීම් කල මුදල අයකල යුතුවේ. | සභා මන්ත්‍රී ඉල්ලීම මත මාර්ගයේ පළල වැඩි කිරීම නිසා මෙසේ ගෙවීම් කර තිබුණු අතර අනුමැතියන් ලබාගෙන නොතිබුණි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) මාර්ග 03 ක කොන්ක්‍රීට් ඇතිරීම වෙනුවෙන් රු.2.298,689 ක් ගෙවීම් කර තිබුණ ද මාර්ගයේ මතුපිට ගල් මතුවී ගුණත්වය අඩු වී තිබුණි. | කොන්ත්‍රාත් සමිති විසින් මාර්ග නිවැරදිව සකස් කරන තෙක් අතරුදවුම් නිදහස් නොකල යුතුවේ. | ඉදි කිරීම් කරන අවස්ථාවේ වර්ෂාවට අසුවීමෙන් මාර්ග ගුණත්වය අඩු වී තිබුණු අතර කොන්ත්‍රාත් කරු ලවා නැවත සකස් කරන බව දන්වමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1 (ඉ),(ඊ) හා (උ) හි දක්වා ඇති අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. | පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදි නිවැරදි කරමි. |